සුවෙන් පෙරට

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| වාරය - තෙවන වාරය | | |
|---|---|---|
| ශ්‍රේණිය : 9 ශ්‍රේණිය | විෂයය : සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | පාඩම : ගිනි මැල ගසා සතුටු වෙමු. |









## නිවැරදි ලෙස ගිනි මැලයක් සකස් කරන ආකාරය

- පළමුව ගිනිමැලය සකස් කිරීමට බලාපොරොත්තු වන ස්ථානය වටේ ශුද්ධ පවිත්‍ර කළ යුතු වේ .
- ගිනිමැලය සකස් කරන ස්ථානයේ තණකොළ ඇත්නම් පස් පිඩලි කපා ඉවත් කර තබා ගන්න
- ඉන්පසු විශාල කොට යොදා ගනිමින් ගිනිමැලේ වටේ ආරක්ෂක පවුර නිර්මාණය කර ගන්න
- ගිනිමැලය ආසන්නයට යාමට දොරටුවක්සකස් කර ගන්න
- නිර්මාණය කරගත් ආරක්ෂක පවුලේ පවුරේ හරි මැදට වන සේ ලී කැබලි කිහිපයක ගෙන බිම අතුරන්න

## ගිනිමැල දැල්වීමේ විවිධ ප්‍රයෝජන

- ආලෝකය ලබා ගැනීම
- සීතල අඩු කිරීම හා උණුසුම ලබා ගැනීම
- ආහාර වර්ග පිස ගැනීම හෝ පුළුස්සා ගැනීම
- වන සතුන්ගෙන් ආරක්ෂා වීම හා සතුන් පලවා හැරීම
- සංඥාවක ලෙස භාවිතා කිරීම
- සතුට හා විනෝදය ලබා ගැනීම

## විවිධ ගිනිමැල වර්ග

- A හැඩ ගිනි මැල
- පරාවර්තන ගිනි මැලය
- සෘජුකෝණාස්‍ර ගිනිමැල
- පිරමීඩ ගිනි මැලය

- ගිනිමැල සංදර්ශන යක් පැයක් හෝ පැය එකහමාරකින් අවසන් කිරීමට කටයුතු සැලසුම් කළ යුතු අතර එක් එක් අංග සඳහා උපරිම ලෙස විනාඩි 5ක කාලයක් ලබා දීම ප්‍රමාණවත් වේ
- ගිනිමැල සංදර්ශනය මෙහෙයවීම සඳහා නායකයෙකු පත් කළ යුතුය
- අවසානයේදී ජාතික ගීය ගායනා කිරීමෙන් සංදර්ශනය අවසන් කෙරේ.




# ගිනි මැල සංදර්ශන



පැවරුම්

1) ගිනිමැළ යොදා ගැනෙන අවස්ථා දෙකක් නම් කරන්න.
2) ගිනි මැළ දැල්වීමේ ප්‍රයෝජන 5 ක් ලියන්න .
3) ගිනිමැළ දැල්වීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු 3 ක් ලියන්න .
4) දර අසුරන ආකාරය අනුව ගිනි මැල වර්ග කීපයකි. ඒ මොනවාද ?
5) ඒවාහි රූප සටහන් දක්වන්න.